මගේ අංකය:-JSC/SEC/CIR/2022

අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක :- 454

සියලුම
මහාධිකරණ විනිසුරුවරුන්,
දිසා විනිසුරුවරුන්/ මහේස්ත්‍රාත්වරුන්,
ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්/ අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත,

<u>අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්/ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරුන් හමුවීම.</u>

අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම්ගේ 2021.01.21 දිනැති චක්‍රලේඛ අංක 444 මගින් අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම්/ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරු වෙත දුරකථනයෙන් ගැටලු ඉදිරිපත් කිරීමට ලබාදුන් ඉඩප්‍රස්ථාවට අමතරව අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයට පැමිණ අදාල ගැටලුව සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදීම සඳහා අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 444 පහත පරිදි සංශෝධනය කරනු ලැබේ. ඒ අනුව **<u>2022.10.03 දින සිට</u>** ක්‍රියාත්මක වන පරිදි පහත සඳහන් ලෙස කටයුතු කලයුතු බව මෙයින් දන්වමි.

I. අදාල නිලධාරියා/ නිලධාරිනිය විසින් සිය අභියාචනා/ ඉල්ලීම් තම දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය සහිතව තැපැල් මගින් හෝ 0112- 446111 ෆැක්ස් අංකය මගින් අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය වෙත මුලින්ම යොමු කල යුතුය.

II. එලෙස ඉදිරිපත් කරනු ලබන අභියාචනා සම්බන්ධයෙන් එකී නිලධාරියාට/ නිලධාරිනියට තවදුරටත් අධිකරණ සේවා කොමිෂන් සභාවේ නිලධාරීන්ට පුද්ගලිකවම කරුණු ඉදිරිපත් කිරීමට අවශ්‍යනම් ඒ සඳහා 0112 -433119 දුරකථන අංකයට ඇමතුමක් ලබාදී ලියාපදිංචි විය යුතුය. තවද එම ලියාපදිංචි වන අවස්ථාවේදී අභියාචනා සම්බන්ධයෙන් කරුණු දැක්වීමට අවශ්‍ය ආකාරය (දුරකථනය මගින් සාකච්ඡා කිරීමටද/ අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයට පැමිණ අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් හෝ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරුන් හමුවීමටද යන්න) පැහැදිලිව සඳහන් කල යුතුවේ.

III. එසේ ලියාපදිංචි වීම සඳහා සතියේ <u>බදාදා හෝ බ්‍රහස්පතින්දා</u> දිනයන්හි අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ අධිකරණ රෙජිස්ට්‍රාර් නිලන්ති ෂාමනී මෙනවිය වෙත දුරකථන ඇමතුමක් ලබාදී ඒ සඳහා දිනයක් හා වේලාවක් වෙන්කර ගත යුතුය.

IV. ඒ අනුව අවශ්‍යතාවය සලකා බලා සතියේ <u>සඳුදා</u> දිනක අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්/ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරුන් වෙත අදාල ගැටලුව සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කිරීමට ඉඩ ප්‍රස්ථාව ලබාදීමට කටයුතු කරනු ඇත. කෙසේවුවද එක් දිනකට විශාල නිලධාරීන් සංඛ්‍යාවක් පැමිණෙන බැවින්, දුරකථනය මගින් හෝ අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයට පැමිණ කරුණු ඉදිරිපත් කිරීමට හෝ එක් නිලධාරියකුට විනාඩි 10කට වඩා වැඩි කාලයක් ලබා දීම දුෂ්කර වනු ඇත.

02. මෙ හැර සතියේ අනෙකුත් දින වල නොදන්වා පැමිණ අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්තුමා හෝ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරුන් හමුවීමට නොහැකි බවද විවිධ ඉල්ලීම් පිලිබඳව කොමිෂන් සභාවේ සේවයේ නියුතු අනෙකුත් නිලධාරීන්ට දුරකථන ඇමතුම් ලබාදී විස්තර විමසීමෙන් වැළකිය යුතු බවද වැඩිදුරටත් අවධාරණය කරමි.

එච්.සංජීව සෝමරත්න
අධිකරණ සේවා කොමිෂන් සභාවේ
ලේකම්

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2022 සැප්තැම්බර් මස 16 දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදී ය.